අපේ අංකය:සං/ප්‍රති/01,
චක්‍රලේඛ අංක.74
කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය,
අංක.70, පාර්ලිමේන්තු පාර,
පැලවත්ත, බත්තරමුල්ල
2015.02.    වෙනි දින.

සියලුම ප්‍රාදේශිය කළමණාකරුවන් වෙත.

<u>තේ නැවත වගාව සහ අළුත් වගාව යටතේ ගෙවනු ලබන සහනාධාර මුදල වැඩිකිරීම.</u>

නැවත වගාව සහ අළුත් වගාව යටතේ ගෙවනු ලබන සහනාධාර මුදල 2015.01.01 දින සිට බලපැවැත්වෙන පරිදි පහත සඳහන් ආකාරයට වැඩිකරනු ලැබ ඇත.

2015.01.01 දින සිට නිකුත් කරනු ලබන සියළු අවසරපත්‍ර සඳහා වැඩිකරන ලද සහනාධාර මුදල අනුව ගෙවීම් සකස් කලයුතු අතර 2015.01.01 දිනට පෙර නිකුත් කරන ලද අවසර පත්‍ර සඳහා සකස් කරනු ලබන ගෙවීම් වෙනුවෙන් 2013.01.16 දාතමින් නිකුත් කරන ලද චක්‍රලේඛ අංක 73 පරිදි ගෙවීම් සකස් කලයුතු බව අවධාරණය කරමි.

1. <u>තේ නැවත වගාව.</u>

i. පස සාරවත් කිරීම සහිතව තේ නැවත වගාව සඳහා දනට ගෙවනු ලබන සහනාධාර මුදල සියළුම තේ වගා කලාප සඳහා හෙක්ටයාරයකට රුපියල් 500,000/-ක් වන පරිදි වැඩිකර ඇති අතර, එම මුදල පහත දක්වෙන ආකාරයට ගෙවීමට කටයුතු කලයුතුය.

| වාරිකය | හෙක්ටයාර් (01) රුපියල් |
|---|---|
| 1. බිම් සැකසීම | 130,000/= |
| 2. පස සාරවත් කිරීම - 1 | 50,000/= |
| 3. පස සාරවත් කිරීම - 11 | 200,000/= |
| 4. තේ වගා කිරීම | 70,000/= |
| 5. වසරක් තුල නඩත්තුව | 50,000/= |
| එකතුව | 500,000/= |

ii. පස සාරවත් කිරීම සහිතව තේ නැවත වගාව යටතේ එක් ඉඩම් හිමියෙකුට වසරකට අවසරපත්‍ර නිකුත් කරන උපරිම බිම් ප්‍රමාණය හෙක්ටයාර් 2 ක් වේ.

2. තේ අලුත්වගාව :

ක්ෂේත්‍ර පරීක්ෂණවල නිර්දේශය පදනම් කරගෙන පහත සඳහන් පරිදි පස සාරවත් කිරීම සහිතව හා පස සාරවත් කිරීමෙන් තොරව තේ අලුත් වගාව යටතේ අවසර පත්‍ර නිකුත් කිරීමට කටයුතු කල හැකිය.

පස සාරවත් කිරීම සහිතව හෝ පස සාරවත් කිරීමෙන් තොරව අලුත් වගාව යටතේ එක් ඉඩම් හිමියෙකුට වසරකට අවසර පත්‍ර නිකුත් කරන උපරිම බිම් ප්‍රමාණය හෙක්ටයාර්. 0.4047(අක්කර 01) කට සීමා කෙරේ.

(අ) පස සාරවත් කිරීම සහිතව - තේ අලුතින් වගාකිරීම.

පස සාරවත් කිරීම සහිතව තේ අළුත් වගාව සඳහා ගෙවනු ලබන සහනාධාර මුදල හෙක්ටයාරයට රුපියල් 400,000/=ක් වන පරිදි සංශෝධනය කර ඇති අතර මුදල පහත පරිදි ගෙවීමට කටයුතු කලයුතුය.

| වාරිකය | හෙක්ටයාර් (01) රුපියල් |
|---|---|
| 1. බිම් සැකසීම<br>2. පස සාරවත් කිරීම - 1<br>3. පස සාරවත් කිරීම - 11<br>4. තේ වගා කිරීම<br>5. වසරක් තුල නඩත්තු | 110,000/=<br>40,000/=<br>160,000/=<br>50,000/=<br>40,000/= |
| එකතුව | 400,000/= |

(ආ) පස සාරවත් කිරීමෙන් තොරව - තේ අලුතින් වගා කිරීම.

මෙම අවසර පත්‍ර සඳහා ගෙවීම් කිරීමේදී පස සාරවත් කිරීම රහිතව පහත සඳහන් පරිදි හෙක්ටයාර්යකට රුපියල් 310,000/=ක් වනසේ ගෙවීමට කටයුතු කළයුතුය.

| වාරිකය | හෙක්ටයාර් (01) රුපියල් |
|---|---|
| 1. බිම් සැකසීම<br>2. තේ වගාකිරීම<br>3. වසරක් තුල නඩත්තුව | 110,000/=<br>160,000/=<br>40,000/= |
| එකතුව | 310,000/= |

පස සාරවත් කිරීමෙන් තොරව අළුත් වගාව යටතේ ඇති අනෙකුත් කොන්දේසි චක්‍රලේඛ අංක.69 පරිදි ඒ ආකාරයෙන්ම බලපැවැත් වේ.

මෙම චක්‍රලේඛය ලද බවත් ඒ අනුව ක්‍රියා කරන බවත් සනාථ කළයුතුය. මේ පිළිබඳව ඔබගේ සියළුම කාර්ය මණ්ඩලය දැනුවත් කලයුතු අතර දැන්වීම් පුවරුවේ දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමටද කටයුතු කරන්න.

සභාපති.

පිටපත්:

1. සාමාන්‍යාධිකාරී
2. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සංවර්ධන /ව්‍යාප්ති)
3. සහකාර සාමාන්‍යාධිකාරී (පරිපාලන / සේවා)
4. අභ්‍යන්තර විගණක
5. කළමනාකරු (මුදල්)
6. කළමනාකරු (සැලසුම් හා නියමුකිරණ / ප්‍රජා සංවර්ධන)
7. සියළුම මාණ්ඩලික නිලධාරින්
8. සියලුම කාර්යභාර නිලධාරින්
9. සියළුම තේ පරීක්ෂක / ව්‍යාප්ති නිලධාරින්
10. ගරු සභාපති /ගරු ලේකම් සමස්ත ලංකා සමිති සංවිධානය.